TVEC

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

NVQ චක්‍රලේඛන අංක 06/2024

සියළුම ප්‍රතීතනය කරන ලද පුහුණු ආයතන,

**<u>ප්‍රතීතනයකරන ලද පුහුණු වැඩසටහන් සඳහා ශිෂ්‍ය බඳවාගැනීම් අවම වීම.</u>**

NVQ පාඨමාලා කර්මාන්ත කුසලතා අවශ්‍යතා වෙනුවෙන් නිර්මාණය වූවද, ප්‍රතීතනය කරන ලද NVQ පාඨමාලා සඳහා ශිෂ්‍ය බඳවාගැනීම් අවම වීම, ශ්‍රම වෙළඳපොළ පදනම්වූ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන (TVET) ක්ෂේත්‍රයේ ප්‍රධාන ගැටළුවක් වී ඇත.

2023 දී සමස්ත ශිෂ්‍ය ධාරිතාවෙන් 58%ක් බඳවාගෙන ඇති අතර එය 2025 වර්ෂය වන විට මුළු ශිෂ්‍ය ධාරිතාවෙන් 70% දක්වා වැඩිකළ යුතුය. එමෙන්ම ප්‍රතීතනය කරන ලද පාඨමාලා 187 ක් මුළු ධාරිතාවෙන් 50% ට අඩු ප්‍රමාණයකට බඳවාගෙන ඇති අතර ඉන් පාඨමාලා 60 ක් 2023 වර්ෂය තුළ එක් සිසුවෙකු හෝ බඳවාගෙන නොමැති බවට වාර්ථා වී ඇත.

ඇමුණුමේ ලැයිස්තුගත කර ඇති ප්‍රතීතනය ලත් පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීමට සහ TVEC හි අවසර ලත් ශිෂ්‍ය ධාරිතාව (student capacity) ප්‍රයෝජනයට ගැනීමට පුහුණු සපයන්නන් විසින් ක්‍රියාමාර්ග ගත යුතුය.

පාඨමාලා ප්‍රතීතනය යාවත්කාලීන කිරීමේදී මෙන්ම ඉදිරි අධීක්ෂණ කාර්යයන් වලදී සිසුන් බඳවා ගැනීම සහ කාර්ය සාධනය, ප්‍රමුඛ කාර්ය සාධන නිර්ණායකයක් සේ සලකා කටයුතු කරනු ඇත.

මෙම චක්‍රලේඛය 2024/05/01 දින සිට ක්‍රියාත්මක වේ.

ආචාර්ය කේ. ඒ. ලලිතධීර
අධ්‍යක්ෂ ජනරාල්

Scanned with CamScanner